## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

# අදියර 02

# 2803 - ව්‍යාපාර නීතිය [BLA]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
# 2803 - ව්‍යාපාර නීතිය (BLA)
# නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) ඃ**

**දෙනු ලබන කාලයඃ**

- කියවීම සඳහා විනාඩි 15 යි.
- ලිවීම සඳහා පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- A කොටස, B කොටස සහ C කොටසේ සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය.

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු ඃ

| කොටස | ලකුණු |
|---|---|
| A | 25 |
| B | 50 |
| C | 25 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත.
- මෙම ප්‍රශ්න පත්‍රය  සඳහා සමත්වීමේ ලකුණු 50 කි.

**උත්තරඃ**

- සියළුම උත්තර, සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත.
- වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්‍ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්‍ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ.
- කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

| වාස්ථවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)<br>අනිවාර්ය ප්‍රශ්න 15 කි | **A කොටස** |
|---|---|

(මුළු ලකුණු 25)

### *01 වන ප්‍රශ්නය*

අංක **1.1** සිට **1.5** දක්වා වූ ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න:

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ කුමක්ද?

(1) ජාත්‍යන්තර ගිවිසුම්, විදේශ ප්‍රතිපත්ති තීරණ නියාමනය කිරීම සහ මූලික අයිතිවාසිකම් සහතික කිරීමට.

(2) රටේ උත්තරීතර නීතිය ලෙස කටයුතු කිරීම, රාජ්‍ය ආකෘතිය ස්ථාපිත කිරීම සහ මූලික අයිතිවාසිකම් සහතික කිරීමට.

(3) ලාංකීය රාජධානිවල ඓතිහාසික සංවර්ධනය ගෙනහැර දැක්වීමට.

(4) ආගමික ආයතන සහ සංස්කෘතික පිළිවෙත් සඳහා මාර්ගෝපදේශ සැකසීමට.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ මූලික අපරාධ අධිකරණ බලය ඇත්තේ කුමන අධිකරණයට ද?

(1) අභියාචනාධිකරණය. (2) මහේස්ත්‍රාත් අධිකරණය.

(3) පවුල් අධිකරණය. (4) දිස්ත්‍රික් අධිකරණය.

1.3 විකුණුම් ගිවිසුමට එළැඹීමෙන් පසු විකුණුම්කරු විසින් නිෂ්පාදනය කරන ලද හෝ අත්පත් කරගන්නා භාණ්ඩ වනුයේ :

(1) අවිනිශ්චිත භාණ්ඩ. (2) පවතින භාණ්ඩ.

(3) නිශ්චිත භාණ්ඩ. (4) අනාගත භාණ්ඩ.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, 1927 අංක 25 දරණ විනිමය බිල්පත් ආඥා පනත මගින් හඳුනාගෙන ඇති ගනුදෙනු කළ හැකි ලියවිල්ලක් **නොවන්නේ** කුමක්ද?

(1) චෙක්පත්. (2) පොරොන්දු නෝට්ටු.

(3) මුදල් ඇණවුම්. (4) විනිමය බිල්පත්.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා නීතිය යටතේ විනිමය බිල්පත් සම්බන්ධයෙන් "යථාකාලීන දරන්නා" යන්න නිවැරදිව විස්තර කරනු ලබන්නේ කුමක් ද?

(1) නැති වූ බිල්පතක් සොයාගෙන ගෙවීමට ඉල්ලා සිටීමට උත්සාහ කරනු ලබන පුද්ගලයෙක්.

(2) බිල්පතක් කල්පිරීමෙන් පසු එය දරා සිටින පුද්ගලයෙක්.

(3) වටිනාකමක් සඳහා බිල්පතක් සද්භාවයෙන් එය කල් ඉකුත් වීමට පෙර සහ හිමිකමේ කිසිදු දෝෂයක් පිළිබඳ දැනුම් දීමකින් තොරව ලබා ගන්නා පුද්ගලයෙක්.

(4) බිල්පත ලියා පිටසන් නොකර තබා ගන්නා ලද පුද්ගලයෙක්.

1.6 පහත සඳහන් ඒවායින් විනිමය බිලක ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?

(1) එය කොන්දේසි විරහිත නියෝගයන් දරා සිටිය යුතුය.

(2) එය ලිඛිත විය යුතුය.

(3) කල්පවත්නා තීන්ත සහිත මුද්‍රිත ආකාරයෙන් තිබිය යුතුය.

(4) එය නිකුත් කරන පුද්ගලයා විසින් අත්සන් කළ යුතුය. (එකකට ලකුණු 02 බැගින් ලකුණු 12)

අංක **1.7** සිට **1.9** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.7 සමථකරණය (mediation), බේරුම් කිරීම (arbitration), ඔම්බුඩ්ස්මන් (ombudsman) ක්‍රියාවලිය වැනි විකල්ප ආරවුල් නිරවුල් කිරීමේ යාන්ත්‍රණ විධිමත් අධිකරණ පද්ධතියකට සමගාමීව ක්‍රියාත්මක වන අතර එමගින් ආරවුල් විසඳීම සඳහා වේගවත් සහ වඩාත් නම්‍යශීලි ක්‍රම සපයයි.

1.8 ශ්‍රී ලංකාවේ පොදු නීතිය වන්නේ ඉංග්‍රීසි නීතියයි.

1.9 භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යනු මිලකට විකුණුම්කරු විසින් භාණ්ඩවල අයිතිය ගැනුම්කරුට පැවරීම හෝ පැවරීමට එකඟ වන ගිවිසුමකි. (එකකට ලකුණු 01 බැගින් ලකුණු 03)

අංක **1.10** සිට **1.14** දක්වා ඇති ප්‍රශ්න වලට උත්තර ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.10 භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සහ අනෙකුත් ගිවිසුම් අතර වෙනස්කම් දෙකක් (02) සඳහන් කරන්න.

1.11 පුද්ගලික දත්ත ආරක්ෂක පනතේ අරමුණු දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

1.12 චෙක්පත් රේඛන වර්ග දෙකක් (02) සඳහන් කරන්න.

1.13 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ, සංස්ථාපනය කළ හැකි සමාගම් වර්ග දෙකක් (02) ලැයිස්තුගත කරන්න.

1.14 කොළඹ කොටස් වෙළඳපොළේ කාර්යයන් දෙකක් (02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින් ලකුණු 10)

(මුළු ලකුණු 25)

***A* කොටසේ අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න (05) කි**

(මුළු ලකුණු 50)

**B කොටස**

## *02 වන ප්‍රශ්නය*

**U. Riya මහතා** විසින් රසායනික පොහොර ශ්‍රී ලංකාවට ආනයනය කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ. ඔහු වියට්නාමයෙන් රුපියල් බිලියන 100 ක් වටිනා රසායනික පොහොර මිලදී ගත් අතර පොහොර තොගය **Sea Breeze** නම් නෞකාවෙන් ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කරන ලදී. කෙසේවෙතත්, රසායනික පොහොර භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළින් වැඩිවන විරෝධය හේතුවෙන්, නෞකාව මාසයකට ආසන්න කාලයක් ඉන්දිය වෙරළ තීරය අසල අතරමං විය.

නෞකාවේ කපිතාන්වරයා වන, **කපිතාන් සිල්වාට**, දිගු කාලයක් පොහොර, මුහුදේ නිරාවරණය වීම නිසා පොහොර බහාලුම් රසායනික ප්‍රතික්‍රියාවලට භාජනය වන බව දක්නට ලැබුණි. තවදුරටත් සිදුවන හානිය සහ විය හැකි පාරිසරක හානිය වැළැක්වීම සඳහා ගබඩා වියදම් ඔහු පෞද්ගලිකව දරමින් චෙන්නායි වරායේ පොහොර බාගෙන ගබඩා කිරීමට තීරණය කරන ලදී. මෙම තත්ත්වය දැනුම් දීම සඳහා ඔහු විසින් **U. Riya** මහතාව සම්බන්ධ කර ගැනීමට කිහිපවරක් උත්සාහ කළද සම්බන්ධ කරගැනීමට නොහැකි විය.

සති දෙකක කාලයකින් පසු, දිගටම ගබඩා කරගෙන යාමට මුදල් නොමැති වූ පසු, **කපිතාන් සිල්වා** විසින් පොහොර රුපියල් මිලියන 75කට විකිණීමට තීරණය කරන ලදී. පසුව ඔහු විකිණීමෙන් ලද මුදල, **U. Riya** මහතාට ප්‍රේෂණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ;**

(a) **කපිතාන් සිල්වාට,** ඔහු කළ පියවරයන් සැළකිල්ලට ගෙන **U. Riya මහතා** වෙනුවෙන් නියෝජිතයකු ලෙස කටයුතු කළ බවට ප්‍රකාශ කළ හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **කපිතාන් සිල්වාට, U. Riya මහතාගෙන්** ගබඩා පිරිවැය අයකර ගැනීමට අයිතියක් තිබේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## *03 වන ප්‍රශ්නය*

**අනුර, බිමල්** සහ **චාමික** එක්ව ශ්‍රී ලංකාව තුළ **"Green Basket"** නමින් පරිසර හිතකාමී සිල්ලර වෙළෙඳසැල් දාමයක් පවත්වාගෙන යාම සඳහා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ලාභා'ලාභ සමානව බෙදා ගැනීමට ඔවුන් එකඟ විය. **අනුර** සහ **චාමික** එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කළ අතර, **බිමල්** ප්‍රාග්ධනය ආයෝජනය කළ නමුත් කළමනාකරණ තීරණවලට සම්බන්ධ නොවී නිහඬව සිටින ලදී.

**අනුර** හෝ **බිමල්ට** නොදන්වා, **චාමික** විසින් ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා **"Green Basket"**නමින් විශාල ණය මුදලක් සැපයුම්කරුවෙකුගෙන් ලබා ගන්නා ලදී. අවාසනාවකට පුළුල් කිරීම අසාර්ථක වූ අතර ව්‍යාපාරයට සැලකිය යුතු පාඩු සිදුවිය. සැපයුම්කරු විසින් හවුල්කරුවන් තිදෙනාගෙන්ම ආපසු ගෙවීම ඉල්ලා සිටී.

මේ අතර, **බිමල්** පවසන්නේ තමන් කළමනාකරණ කටයුතුවලට හෝ තීරණ ගැනීමට සම්බන්ධ නොවූ නිසා තමා වගකිව යුතු නොවන බවය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල් ව්‍යාපාර නීතිය යටතේ, **චාමික** විසින් ලබාගත් ණය සඳහා **බිමල්** වගකිව යුතුද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **චාමිකගේ** ක්‍රියාකලාපයේ නීතිමය තත්වය සහ සැපයුම්කරුට, හවුල් ව්‍යාපාරයෙන් ගෙවීම් අයකර ගත හැකි ද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## *04 වන ප්‍රශ්නය*

**ඩිලානි** යනු තිරසර නිෂ්පාදිත ඇසුරුම්කරණය පිළිබඳව විශේෂඥ සමාගමක් වන **සීමාසහිත EcoPack (පෞද්ගලික) සමාගමේ,** ග්‍රැෆික් නිර්මාණ ශිල්පියෙකි. ඇය සතියකට දින පහක් සමාගමේ කාර්යාලයේ සේවය කරන අතර, නියමිත වැඩ කරන වෙලාවන් පිළිපදිමින්, සමාගමේ උපකරණ භාවිතා කරන අතර, ඇය අලෙවි කළමනාකරු වෙත සේවයට වාර්තා කරයි. ඇයට වැටුප් සහිත නිවාඩු ප්‍රතිලාභ සමඟ මාසික ස්ථාවර වැටුපක් ලැබේ.

ඒ සමගම, සමාගමේ නව නිෂ්පාදිතයක් දියත් කිරීම සඳහා ප්‍රවර්ධන වීඩියෝවක් නිර්මාණය කිරීම සඳහා නිදහස් (freelance) වීඩියෝ සංස්කාරකයෙකු වන **රුවන්** බඳවා ගන්නා ලදී. **රුවන්** නිවසේ සිට වැඩ කරන අතර තමාගේම උපකරණ භාවිතා කරමින් තමාගේම කාලසටහනකට අනුව වැඩ කරන අතර, ඔහු සම්පූර්ණ කරනු ලබන ව්‍යාපෘති සඳහා ගෙවීම් සිදුකරනු ලැබේ. ඔහු විසින් තවත් සමාගම් දෙකක් සඳහා මේ හා සමාන නිදහස් (freelance) වැඩ භාරගෙන ඇත.

මෑතකදී **EcoPack සමාගම** විසින් අයවැය කප්පාදුව යටතේ **ඩිලානි** සහ **රුවන්** යන දෙදෙනාගේම සේවය අවසන් කරනු ලැබීය. **ඩිලානි** විසින් රැකියා නීති (employement laws) යටතේ වන්දි ඉල්ලා සිටින නමුත්, සමාගම පවසන්නේ ඇය **රුවන්** මෙන් ස්වාධීන කොන්ත්‍රාකරුවකු බවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කම්කරු නීතිය යටතේ සේවා ගිවිසුමක් සහ සේවා සඳහා ගිවිසුමක් අතර නීතිමය වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **ඩිලානි** යනු සේවකයෙක්ද, නැතහොත් ස්වාධීන කොන්ත්‍රාකාරියක්ද යන්න සහ ඇයට රැකියා ආරක්ෂණය සඳහා හිමිකම් තිබේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**සේනක මහතා** තම නිවස රක්ෂණය කිරීමට තීරණය කළ අතර රක්ෂණ යෝජනා පත්‍රය සහ සම්බන්ධ ප්‍රශ්න ගණනාවකට පිළිතුරු ලබා දෙන ලදී. අවසානයේදී, ඔහු **සීමාසහිත Safe Guard රක්ෂණ පොදු සමාගමේ** නිවාස රක්ෂණ ඔප්පුවක් ලබාගත් අතර, එමගින් සොරකම් නිසා වන හානි ආවරණය කරයි. ඒක් රාත්‍රියක, සොරුන් විසින් ඔහුගේ නිවස බිඳිනු ලැබූ අතර, සොරුන් ඇතුළු වීමේදී නිවසේ දොර සහ ජනේල කිහිපයකට හානි සිදුකරන ලදී. දින කිහිපයකට පසු, හානිවූ ජනේල හරහා වර්ෂා ජලය ඇතුළු වී ඔහුගේ නිවසේ අභ්‍යන්තරයට සැලකිය යුතු ජල හානියක් සිදු කළේය.

**සේනක මහතා** විසින් සම්පූර්ණ හානිය සඳහා හිමිකම් ඉල්ලුම් කරන ලදී. කෙසේවුවද, සොරකම් ආශ්‍රිත හානි පමණක් රක්ෂණය කර ඇති බවට තර්ක කරමින් **සීමාසහිත Safe Guard රක්ෂණ පොදු සමාගම** සම්පූර්ණ හිමිකම පෑම ප්‍රතික්ෂේප කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) රක්ෂණ මූලධර්ම දෙකක් (02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **සීමාසහිත Safe Guard රක්ෂණ පොදු සමාගම** සම්පූර්ණ හානිය සඳහා වගකිව යුතුද යන්න **විමසන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) නීති විරෝධී ක්‍රියාකාරකම් තුළින් උපයනු ලබන මුදල් එහි නීති විරෝධී සම්භවය සඟවමින් විධිමත් මූල්‍ය පද්ධතියකට හඳුන්වා දෙනු ලබන වංචා සහගත ක්‍රමයක් වන්නේ මුදල් විශුද්ධිකරණයයි. මෙම ක්ෂේත්‍රය ආවරණය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත හඳුන්වා දෙනු ලැබීය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ ආවරණය වන වැරදි (නීති විරෝධී ක්‍රියාකාරකම්) හතරක් **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පණත යටතේ පිළිගත් බුද්ධිමය දේපල වර්ග රාශියක් පවතී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

බුද්ධිමය දේපළ පනතේ පිළිගත් පහත සඳහන් බුද්ධිමය දේපළ වර්ග **පැහැදිලි කරන්න**:

(i) ප්‍රකාශන අයිතිය (copy right).

(ii) වෙළඳ නාම (Trade names). (ලකුණු 04)

(c) 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීම සහ මුදල් විශුද්ධි කරන වැළැක්වීම **(AML)** සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම **(CFT)** පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රට පෙළ ගැස්වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අරමුණු දෙකක් (02) **සඳහන් කරන්න.**

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

## *B කොටසේ අවසානය*

**අනිවාර්ය ප්‍රශ්නයකි (01)**

## C කොටස

(මුළු ලකුණු 25)

### *07 වන ප්‍රශ්නය*

(A) සුප්‍රසිද්ධ වෘත්තීය සම්භාව්‍ය වයලින් ශිල්පිනියක වන **කලනි පෙරේරා** මාස දෙකක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර ආවරණය වන පරිදි පවත්වනු ලබන ඉතා ජනප්‍රිය ප්‍රසංග චාරිකාවක නියැලීම සඳහා **සීමාසහිත Golden Stage Prodcutions (පෞද්ගලික) සමාගම** සමග ලිඛිත ගිවිසුමකට එළඹුණි. ගිවිසුමේ ඉතා පැහැදිලි ලෙස සඳහන්ව ඇත්තේ:

*"පළමු සංදර්ශනයට සතියකට පෙර සැළසුම්කර ඇති තාක්ෂණික පෙරහුරු සම්පූර්ණ දින පහටම **කලනි පෙරේරා** සහභාගි විය යුතුය."*

ආලෝකකරණය සහ ශබ්ද ඉංජිනේරුවන් සමග සම්බන්ධීකරණය සඳහා මෙම පෙරහුරු ඉතා වැදගත් වේ. පෙරහුරු ආරම්භයට දින 03 කට පෙර, **කලනි පෙරේරාට** සුළු අසාත්මිකතාවයක් ඇති වූ අතර, වෛද්‍ය උපදෙස් මත පෙරහුරුවේ පළමු දින දෙක මග හැරුණි. ඇය ඉක්මන් සුවය ලැබූ අතර, අවසන් දින තුනට සහභාගී වූ අතර අවසන් සම්පූර්ණ වේදිකා පුහුණුව අතරතුර ඇය කිසිදු දෝෂයකින් තොරව ක්‍රියා කළාය. ඇය ප්‍රසංග සඳහා සම්පූර්ණයෙන්ම සූදානමින් සිටින ලදී.

කෙසේ වුවද මගහැරුණු පෙරහුරු, ගිවිසුමේ අත්‍යාවශ්‍ය කොන්දේසියක් උල්ලංඝනය වීමක් ලෙස පවසමින්, **Golden Stage Prodcutions** ගිවිසුම අවසන් කරන ලදී. අතපසු වූ දිනයන් කොන්දේසියක් කඩ කිරීමක් නොවන බවත්, එය වගකීමක් පමණක් වන බවත්, ගිවිසුම්ගත රඟ දැක්වීම සඳහා ඇයට පූර්ණ හැකියාවක් තිබූ බවත්, තර්ක කරමින් **කලනි පෙරේරා** විසින් නඩු පවරන ලදී.

ගිවිසුම තුල වෙනමම මුද්‍රිත වගන්තියකින් සඳහන් වූයේ:

*"කිසිම තත්වයක් යටතේ රංගන ශිල්පීන් අවලංගු කිරීම හෝ ආදේශ කිරීම හේතුවෙන් පැන නගින කිසිදු හිමිකම් පෑමක් හෝ වන්දියක් සඳහා සමාගම වගකියනු නොලැබේ."*

සේවයෙන් පහ කිරීම අසාධාරණ වුවද මෙම වගන්තිය නිසා ඔවුන්ට කිසිඳු වගකීමක් දැරිය යුතු නොවන බවට තර්ක කළ හැකි යැයි **Golden Stage Prodcutions** විශ්වාස කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ගිවිසුමක් කඩ කිරීම නිසා සහනයක් අපේක්ෂා කරන පාර්ශවයකට ලබාගත හැකි ගිවිසුම්ගත ප්‍රතිකර්ම (03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) මගහැරුණු පෙරහුරු දින කොන්දේසි හෝ ප්‍රතිඥාභාරයක් කඩ කිරීමක්ද යන්න සහ **Golden Stage Prodcutions** ගිවිසුම අවසන් කිරීම සාධාරණද යන්න **පැහැදිලි කරන්න**.

(ලකුණු 06)

(c) මෙම සිදුවීමේදී ගිවිසුමේ ඇති ව්‍යාතිරේක වගන්තිය මගින් **Golden Stage Prodcutions** වෙත ඇති වගකීමෙන් ආරක්ෂා කෙරෙන්නේද යන්න **විමසන්න**. (ලකුණු 06)

(B) ශ්‍රී පුර රෝහලේ ඖෂධ සැපයුම් අංශයේ ප්‍රධානී **වෛද්‍ය ලේඛා** සැපයුම්කරුවෙකු වන සීමාසහිත **Medi-Co** සමාගමේ ගබඩාවෙන් නිකුත් කළ නියැදියක් පරීක්ෂා කිරීමෙන් පසු ප්‍රතිජීවක පෙට්ටි 1000 ක් සඳහා ඇණවුමක් ඉදිරිපත් කරන ලදී. ප්‍රදර්ශනය කරන ලද නියැදි සාම්පලය ප්‍රසිද්ධ ඖෂධ සමාගමක් විසින් මුද්‍රා තබා සළකුණු කොට ඇත. මෙම නියැදිය මත විශ්වාසය තැබූ **වෛද්‍ය ලේඛා,** නියැදිය මත පදනම්ව මිලදී ගැනීම අවසන් කරන ලදී. කෙසේවුවද, රෝහල වෙත ලැබීමේදී, ඖෂධවල පෙට්ටි වෙනත් නිෂ්පාදකයෙකුගෙන් ලැබී ඇති බවත්, නිසි සහතික කිරීමක් හෝ ඇසුරුම්කරණයක් නොමැති නිසා ඒවයේ සඵලත්වය සහ ආරක්ෂාව පිළිබඳවත් සැක තත්වයක් ඇති වන බවය.

තවද, **වෛද්‍ය ලේඛා** විසින් සිදුකරන පෞද්ගලික ගණුදෙනුවකදී, දේශීය වාහන විකුණුම්කරුවෙකු වන **වන්කා මහතා** පාවිච්චි කරන ලද සුඛෝපබෝගී කාර් රථයක් මිලට ගත් අතර, ඊට අදාල නීත්‍යාණුකූල ලියවිලි ඔහු විසින් ඉදිරිපත් කරන ලදී. සති කිහිපයකට පසුව නීති නිළධාරීන් විසින් මෙම මෝටර් රථය සොරකම් කරන ලද දේපලක් බවට හෙළිකරන ලදී. රථයේ සැබෑ හිමිකරු හිමිකාරීත්වය පිළිබඳ නීතිමය සාක්ෂි ඉදිරිපත් කළ අතර **වෛද්‍ය ලේඛාට** වාහනය ආපසු බාර දීමට සිදු වූ අතර, ඇයට මූල්‍යමය සහ කීර්තිමය අලාභ දැරීමට සිදුවිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ, **සීමාසහිත Medi-Co. සමාගම** ව්‍යාංග කොන්දේසියක් උල්ලංඝනය කර ඇත්දැයි **තක්සේරු කරන්න.** (ලකුණු 05)

(b) මෝටර් රථ අලෙවිකරුවෙකු වන **වන්කා මහතා** භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ කොන්දේසියක් කඩ කර ඇතිදැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 25)

***C කොටසේ අවසානය***

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා<br>විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **මතක තබා ගැනීම**<br><br>කරුණු,පද,මූලික සංකල්ප හෝ පිළිතුරු, ඒවායේ තේරුම නිසි ලෙස තේරුම් නොගෙන සිහිපත් කිරීම වේ | හඳුනා දක්වන්න. | කෙනෙකුගේ හෝ යමක් හඳුනා දැක්වීම. | මාතෘකාවේ ප්‍රධාන කොටස් සොයා නම් කරන්න. |
| | නිර්වචනය කරන්න. | වචනයක් හෝ සංකල්පයක් තේරුම් ගැනීම. | පදයක හෝ සංකල්පයක පැහැදිලි අර්ථයක් ලබා දීම. |
| | හඳුනා ගන්න | පෙර දැක නොමැති දෙයක් පිළිබඳ දැනුවත්භාවය. | පෙර ඉගෙනීම්වලින් යමක් සොය දැන ගැනීම. |
| | සඳහන් කරන්න | පැහැදිලි සහ සංක්ෂිප්ත ලෙස තොරතුරු ප්‍රකාශ කිරීම. | ප්‍රධාන කරුණු හෝ සංකල්ප සරල ආකාරයෙන් ප්‍රකශ කිරීම. |
| | ලැයිස්තුගත කරන්න | නම්, සංඛ්‍යා හෝ අයිතම මාලාවක්. | ප්‍රධාන කරුණු සංවිධානාත්මකව ලිවීම. |
| | සටහන් කරන්න | පද්ධතියකට (ගිණුම්කරණය නොවේ) තොරතුරු ඇතුලත් කිරීම. | අදාල විස්තර පැහැදිලිව හා නිවැරදිව ඇතුලත් කිරීම. |
| **අවබෝධය**<br><br>තොරතුරුවල අර්ථය අවබෝධ කර ගැනීම සහ ඒවා අර්ථකථනය කිරීමට හෝ පැහැදිලි කිරීමට හැකිවීම | ගොඩ නගන්න | මූලිකාංග ඒකාබද්ධ කිරීමෙන් යමක් ගොඩ නැගීම. | විවිධ කොටස් මගින් සමස්ථයක් ලෙස අර්ථවත් බවට පත් කිරීම. |
| | වෙනස් කොට දක්වන්න | දේවල් දෙකක් හෝ වැඩි ගණනක් අතර වෙනස්කම් හඳුනා ගැනීම. | සංකල්ප හෝ අයිතම අතර වෙනස්කම් අවධාරණය කිරීම. |
| | විමසන්න | මාතෘකාවක් පිළිබඳව විවිධ අදහස් සහ මත සලකා බැලීම. | විවිධ දෘෂ්ටිකෝණ ගවේශණය කර අවබෝධයක් ලබා දීම. |
| | පැහැදිලි කරන්න | යමක් පිළිබඳව වඩාත් විස්තරාත්මකව පැහැදිලි කිරීම. | තාර්කික සහ සවිස්තරාත්මක මත විස්තරයක් සැපයීම. |
| | ගෙනහැර දක්වන්න | කරුණක් පැහැදිලි කිරීම සඳහා උදාහරණ, ප්‍රස්ථාර හෝ දෘශ්‍ය භාවිතය. | සුදුසු උදාහරණ හෝ දෘශ්‍ය මාධ්‍ය සමග පැහැදිලි කිරීම් සඳහා සහය වීම. |
| | අර්ථකථනය කරන්න | තොරතුරු හෝ ක්‍රියාවන්හි අර්ථය පැහැදිලි කිරීම. | යමකින් අදහස් වන්නේ කුමක්දැයි ඔබේ වචනවලින් පැහැදිලි කිරීම. |
| | විස්තර කරන්න | යම්කිසි දෙයක් පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්. | අදාල විස්තර ව්‍යුහගත ආකාරයට සැපයීම. |
| | සාරාංශගත කරන්න | ප්‍රධාන කරුණු පිළිබඳව කෙටි ප්‍රකාශයක්. | සංක්ෂිපතව ඉදිරිපත් කිරීම. |

<table>
<tr><th>මට්ටම</th><th>ක්‍රියා ලැයිස්තුව</th><th>නිර්වචනය</th><th>සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස්</th></tr>
<tr><td rowspan="7">භාවිතය<br><br>අළුත් සහ සංකීර්ණ තත්වයන් යටතේ උගත් දැනුම භාවිතා කිරීම වන අතර මේ සඳහා දැනුම සහ කුසලතා ප්‍රායෝගිකව භාවිතා කිරීම අවශ්‍ය වේ.</td><td>භාවිත කරන්න.</td><td>යම්කිසි තත්වයන් තුළ දැනුම කුසලතා හෝ රීතීන් භාවිතා කිරීම.</td><td>ප්‍රතිඵල ලබාදීම සඳහා අදාල දැනුම හෝ ශිල්පීය ක්‍රම භාවිතා කිරීම.</td></tr>
<tr><td>ගණනය කරන්න.</td><td>ගණිතමය හෝ තාර්කික ක්‍රම මගින් අගය තීරණය කිරීම.</td><td>විසඳුමක් ලබා ගැනීම සඳහා සංඛ්‍යාත්මක හෝ තාර්කික ක්‍රියාවලීන් පැහැදිලි කිරීම.</td></tr>
<tr><td>තීරණය කරන්න</td><td>පර්යේෂණ හෝ ගණනය කිරීම් හරහා යමක් ස්ථාපිත කිරීම.</td><td>ගණනය කිරීමෙන් හෝ පර්යේෂණයකින් පසු යමක් සොයාගැනීම හෝ නිගමනය කිරීම.</td></tr>
<tr><td>ප්‍රදර්ශනය කරන්න.</td><td>ක්‍රියාවලිය හෝ ක්‍රමය ප්‍රදර්ශනය කිරීම.</td><td>ව්‍යුහගත පියවර හරහා පැහැදිලි උදාහරණයක් පෙන්වීම.</td></tr>
<tr><td>පිළියෙල කරන්න.</td><td>භාවිතය සඳහා ද්‍රව්‍ය හෝ තොරතුරු සංවිධානය කිරීම.</td><td>කාර්යයක යෙදීමට පෙර අවශ්‍ය විස්තර සකස් කිරීම.</td></tr>
<tr><td>භාවිත කරන්න</td><td>සංකල්පයන් මෙවලමක් හෝ ක්‍රමයන් අරමුණක් සඳහා භාවිතා කිරීම.</td><td>අදාල දැනුම හෝ සම්පත් යෝග්‍ය පරිදි භාවිතා කිරීම.</td></tr>
<tr><td>ඉදිරිපත් කරන්න.</td><td>සඵලදායී ලෙස තොරතුරු බෙදා ගැනීම.</td><td>මූලික දැනීම සහ අවබෝධයන් පැහැදිලිව සහ වෘත්තීමය වශයෙන් ඉදිරිපත් කිරීම.</td></tr>
<tr><td rowspan="7">විශ්ලේෂණය<br><br>ව්‍යුහය සහ සම්බන්ධතා අවබෝධ කරගැනීම සඳහා තොරතුරු කුඩා සංරචකවලට වෙන් කිරීම</td><td>විශ්ලේෂණය කරන්න.</td><td>සංරචක අවබෝධ කරගැනීම සඳහා විස්තරාත්මකව පරීක්ෂා කිරීම.</td><td>වඩා හොඳ අවබෝධයක් සඳහා තොරතුරු ප්‍රධාන කොටස්වලට බෙදීම.</td></tr>
<tr><td>සසඳන්න</td><td>සමානකම් සහ /හෝ වෙනස්කම් පරීක්ෂා කිරීම.</td><td>ප්‍රධාන පොදු ලක්ෂණ සහ වෙනස්කම් පෙන්වා දීම.</td></tr>
<tr><td>වෙනස්කොට දක්වන්න</td><td>යමක් තවෙකින් වෙනස් කොට හඳුනා ගැනීම.</td><td>යමක් එකිනෙකට වෙනස් වන්නේ කුමකින්ද යන්න හඳුනා ගැනීම.</td></tr>
<tr><td>පරීක්ෂා කරන්න</td><td>යමක ස්වභාවය තීරණය කිරීම සඳහා එය පරීක්ෂා කිරීම.</td><td>යමක් හොඳින් තේරුම් ගැනීම සඳහා එය හොඳින් නිරීක්ෂණය කිරිම.</td></tr>
<tr><td>සැකිල්ලක් සේ දක්වන්න</td><td>සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම.</td><td>ප්‍රධාන අංශ පිළිබඳව සංවිධානාත්මක දල විශ්ලේෂණයක් ලබා දීම.</td></tr>
<tr><td>ක්‍රියා කරන්න</td><td>අත්හදා බැලීමක්, සමීක්ෂණයක් හෝ අධ්‍යනයක් සඳහා මූලිකාංග සංවිධානය කිරීම.</td><td>කාර්යයන් ක්‍රමානුකූලව සිදු කිරීම සඳහා ව්‍යුහාත්මක පියවර අනුගමනය කිරීම.</td></tr>
<tr><td>වාර්තා කරන්න</td><td>සොයාගත් දෑ ව්‍යුහාත්මකව ඉදිරිපත් කිරීම.</td><td>විශ්ලේෂණය කළ තොරතුරු පැහැදිලි හා තාර්කික ආකෘතියකින් ඉදිරිපත් කිරීම.</td></tr>
</table>

| මට්ටම | ක්‍රියා ලැයිස්තුව | නිර්වචනය | සිසුන් සඳහා විස්තරාත්මක උපදෙස් |
|---|---|---|---|
| **අගය කරන්න**<br><br>නිර්ණායක හෝ ප්‍රමිතීන් මත පදනම්ව අදහස් හෝ ද්‍රව්‍යයන් වල වටිනාකම හෝ ගුණාත්මක භාවය පිළිබඳව විනිශ්චයන් සිදු කිරීම. | උපදෙස් දෙන්න | යෝජනා හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම | විශ්ලේෂණ මත පදනම්ව දැනුවත් මග පෙන්වීමක් ලබා දීම. |
| | අගය කරන්න | වටිනාකම් සඵලදායීතාවය හෝ බලපෑම පිළිබඳව විවේචනාත්මකව තක්සේරු කිරීම. | නිර්ණායක මත පදනම්ව යම් දෙයක ගුණාත්මකභාවය හෝ අදාලත්වය නිශ්චය කිරීම. |
| | සකස් කරන්න | ව්‍යුහගත ප්‍රවේශයන් හෝ සැලැස්මක් සංවර්ධනය කිරීම. | හොඳින් අර්ථ දක්වන ලද ක්‍රමෝපායන් හෝ උපාය මාර්ගයන් සකස් කිරීම. |
| | නිර්දේශ කරන්න | සුදුසු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා කිරීම. | තාර්කික කරුණු මගින් සහායවන ප්‍රවේශයන් යෝජනා කිරීම. |
| **නිර්මාණය කිරීම**<br><br>සුසංයෝගී හෝ ක්‍රියාකාරී සමස්තයක් සෑදීම සඳහා නව ආකාරවලින් මූලද්‍රව්‍ය ඒකාබද්ධ කිරීම නව අදහස්, නිෂ්පාදන හෝ අවබෝධ කර ගැනීමේ ක්‍රම ජනනය කිරීමේ හැකියාව | නිර්මාණය කරන්න | අළුත් දෙයක් නිර්මාණය කිරීම. | අපූර්ව සහ අරමුණු සහගත යමක් සංවර්ධනය කිරීම. |
| | තක්සේරු කරන්න | ගුණාත්මක භාවය, හැකියාව හෝ ස්වභාවය තක්සේරු කිරීම හෝ ඇගයීම. | පවතින තොරතුරු මත පදනම්ව තර්කාණුකූල විනිශ්චයන් ලබා දීම. |
| | සංවර්ධනය කරන්න | අදහසක්, නිශ්පාදනයක් හෝ සංකල්පයක් පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම. | කාලයත් සමගින් අදහස ශක්තිමත් හා වැඩි දියුණු කිරීම. |
| | යෝජනා කරන්න | සලකා බැලීම සඳහා වන සැලැස්මක් හෝ සංකල්පයක් පිළිබඳ යෝජනා කිරීම. | අදහසක් හෝ ව්‍යුහගත නිර්දේශයක් ඉදිරිපත් කිරීම. |
| | සංයෝජනය කරන්න | විවිධ සංරචකයන්ගේ සංයෝජනය මගින් සංගත සමස්ථයක් නිර්මාණය කිරීම. | විවිධ අදහස් හෝ අවබෝධයන් අර්ථවත් වූ නිගමනයකට ඒකාබද්ධ කිරීම. |
| | සැලසුම් කරන්න | යමක් සඳහා ව්‍යුහගත සැලැස්මක් නිර්මාණය කිරීම. | නිශ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහා සවිස්තරාත්මක ව්‍යුහයන් සකස් කිරීම. |
| | ගොනු කරන්න | විවිධ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු එක් රැස් කිරීම. | එකතු කරන ලද දත්ත පුළුල් ආකෘතියකට සංවිධාන කිරීම. |

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2025 විෂය නිර්දේශය

## ආදර්ශ විසඳුම්

# අදියර 02

# 2803 - ව්‍යාපාර නීතිය [BLA]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

වාස්ථවික පරීක්ෂණ ප්‍රශ්න **(OTQs)**
**අනිවාර්ය ප්‍රශ්න**

(මුළු ලකුණු 25)

**A කොටස**

*1 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු*

1.1 2 1.4 3

1.2 2 1.5 3

1.3 4 1.6 3 **(එකකට ලකුණු 02 බැගින් ලකුණු 12)**

1.7 සත්‍යයි

1.8 අසත්‍යයි

1.9 සත්‍යයි **(එකකට ලකුණු 01 බැගින් ලකුණු 03)**

1.10

| | **භාණ්ඩ විකිණීමේ ගිවිසුම** | **වෙනත් ගිවිසුම්** |
|---|---|---|
| **හිමිකාරිත්වය පැවරීම** | භාණ්ඩවල අයිතිය පැවරීම කෙරෙහි මූලිකවම අවධානය යොමු කෙරේ. | හිමිකාරිත්වය පැවරීම හෝ නො පැවරීමට ඉඩ ඇත. |
| **විෂය වස්තුව** | භාණ්ඩවල අයිතිය පැවරීම වේ. | සේවාවන් සහ රැකියා ණය ඇතුළත් විය හැක. |
| **ගැනුම්කරුගේ අපේක්ෂාව** | ගැනුම්කරු විසින් විකුණුම්කරුගෙන් කිසිදු විශේෂඥතාවයක් හෝ නිපුණතාවක් අපේක්ෂා නොකරයි. | ගැණුම්කරු විකුණුම්කරුගෙන් යම් පෞද්ගලික විශේෂඥතාවක් හෝ නිපුනතාවයක් අපේක්‍ෂා කරයි. |

**(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)**

1.11

- ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුගේ පුද්ගලික දත්තවලට, අනවසරයෙන් ප්‍රවේශවීම, අනිසි ලෙස භාවිතා කිරීම හා හෙළිදරව් කිරීමෙන් ආරක්ෂා කිරීම.
- ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකයේ වර්ධනයට සහ නවෝත්පාදනයට පහසුකම් සැලසීම සඳහා දත්ත නීත්‍යානුකුලව, සාධාරණ සහ වගකීමකින් යුතුව සැකසෙන බව සහතික කිරීම.
- මෙම පුද්ගලික දත්ත සහ එහි භාවිතයට අදාළ අයිතිවාසිකම් පරාසයන්හි වැඩි පාලනයක් අදාළ පුද්ගලයන්ට ලබාදීම. **(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)**

1.12

- සාමාන්‍ය රේබණය.
- විශේෂ රේබණය **(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)**

1.13

- සීමිත සමාගම්.
- වගකීම් අසීමිත සමාගම්.
- ඇපයෙන් සීමිත සමාගම්. **(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)**

1.14

- ප්‍රාග්ධන සම්පාදනයට පහසුකම් සැපයීම.
- සුරැකුම්පත් සඳහා වෙළඳපොළක් සැපයීම.
- ද්‍රවශීලතාවය සහතික කිරීම.
- මිල සොයා ගැනීම.
- ආයෝජන අවශ්‍යතා ප්‍රවර්ධනය කිරීම.
- අධීක්ෂණය සහ නියාමනය කිරීම.
- තොරතුරු බෙදා හැරීම. **(එකකට ලකුණු 01 බැගින් ලකුණු 02)**

**(මුළු ලකුණු 25)**

## *A කොටසේ අවසානය*

**අනිවාර්ය ප්‍රශ්න 05 කි**

(මුළු ලකුණු 50)

## B කොටස

*2 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු*

**04 වන ඒකකය නියෝජ්‍යත්ව නීතිය.**

ඉගෙනුම් ප්‍රතිඵල - ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවයන් හඳුනාගනු ලබන අවස්ථාවන් පැහැදිලි කිරීම.
- ප්‍රධානියාගේ සහ නියෝජිතයාගේ වගකම් හා අයිතීන් පැහැදිලි කිරීම.
- නියෝජිතයන් විසින් සිදුකරනු ලබන ක්‍රියාවන් සඳහා ප්‍රධානියාගේ වගකීම පැහැදිලි කිරීම.

(a) **කපිතාන් සිල්වාට U. Riya** මහතා සමඟ නියෝජිත සම්බන්ධතාවයක් ඇතැයි ප්‍රකාශ කළ හැකි ද යන්න තීරණය කිරීම සඳහා "අවශ්‍යතාවය අනුව නියෝජ්‍යත්වය" යන සංකල්පය සලකා බැලීම අවශ්‍ය වන අතර එය ව්‍යංග නියෝජ්‍යත්ව වර්ගයක් වේ.

පහත සඳහන් කොන්දේසි සපුරා ඇති විට අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය පැන නගිනු ලැබේ.

(1) සැබෑ ලෙසම හදිසි අවස්ථාවක් වීම.

(2) නියෝජිතයාට ප්‍රධානියා සමඟ සන්නිවේදනය කළ නොහැකි වීම.

(3) නියෝජිතයා විසින් සද්භාවයෙන් ප්‍රධානියාගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියාකර තිබීම.

(4) ගනු ලබන ක්‍රියාමාර්ග ප්‍රධානියාගේ දේපල ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය විය යුතු අතර සාධාරණ විය යුතුය.

(5) ප්‍රධානියා විසින් ඊට පටහැනිව පූර්ව ප්‍රකාශිත උපදෙස් ලබා දී නොතිබිය යුතුය.

**මෙම අවස්ථාවේදී:**

- පොහොර බහාලුම්වල සිදුවන රසායනික ප්‍රතික්‍රියා හේතුවෙන් පැහැදිලි හදිසි අවස්ථාවක් ඇති වූ අතර එමගින් හානි හෝ සැලකිය යුතු අලාභයක් ඇති වීමේ අවදානම් මතු විය.
- **කපිතාන් සිල්වා** විසින් **U. Riya මහතාව** සම්බන්ධ කර ගැනීමට කිහිප වතාවක්ම උත්සාහ කළ නමුත්, කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු අතර සන්නිවේදනය කිරීමට නොහැකි වීමේ කොන්දේසිය සපුරා ලීය.
- චෙන්නායි වරාය තුළ භාණ්ඩ ගබඩා කිරීම කිරීමට ඔහු ගත් තීරණය ඔහුගේම වියදමින් සිදුකරනු ලැබූ අතර එයින් පෙන්නුම් කරන්නේ ඔහු සද්භාවයෙන් යුතුව කටයුතු කළ බවයි.
- තවත් සති දෙකක කාලයක් සම්බන්ධතා නොමැතිව සහ ගබඩා කිරීම දිගටම කරගෙන යාමට ප්‍රමාණවත් මුදල් නොමැති වීමත් සමග, ඔහු පොහොර තොගය විකිණීමට තීරණය කරන ලදී. මෙය තවදුරටත් විනාශ වීම සහ අලාභය වැළැක්වීමට ගත් සාධාරණ පියවරකි.

තවද, ඔහු පෞද්ගලික ප්‍රතිලාභය සඳහා නොව **යූරියා මහතාගේ** ලාභය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියා කළ බවට නිගමනය තහවුරු කරමින් රුපියල් මිලියන 75 ක විකිණීමේ ආදායම **U. Riya** මහතාට ප්‍රේෂණය කරන ලදී.

එබැවින් ඉහත සඳහන් කරුණු මත පදනම්ව, **කපිතාන් සිල්වාට** අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය ඉල්ලා සිටිය හැකි / ප්‍රකාශ කළ හැකි අතර, නියෝජ්‍යත්ව නීතිය යටතේ ඔහුගේ ක්‍රියා කලාපය නීතිමය වශයෙන් සාධාරණීකරණය කළ හැකිය.
**(ලකුණු 06)**

**(b)** ඔව්, **කපිතාන් සිල්වාට U. Riya** මහතාගෙන් ගබඩා කිරීමේ පිරිවැය අයකරගැනීමේ හිමිකම පවතී.

අවශ්‍යතාවය අනුව නියෝජ්‍යත්ව පැන නැගීමේ මූලධර්මය යටතේ නියෝජිතයාට (මෙම අවස්ථාවේ **කපිතාන් සිල්වා)** ප්‍රධානියාගේ **U Riya** මහතාගේ දේපල ආරක්ෂා කිරීම සඳහා සද්භාවයෙන් ක්‍රියාකරන අතරතුර සිදුවන ඕනෑම සාධාරණ වියදම් සඳහා ප්‍රතිපූර්ණය කිරීමට හිමිකම් පවතී.

- හානිය වැළැක්වීම සඳහා ගබඩා කිරීම අවශ්‍ය විය.
- **U riya** මහතා ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් පිරිවැය දැරීමට සිදුවිය.
- ගනු ලැබූ ක්‍රියාමාර්ග සාධාරණ සහ එම තත්වයන්ට අනුකූල බැවින් **කපිතාන් සිල්වාට** එම වියදම් සඳහා **U.Riya** මහතාගෙන් ප්‍රතිපූර්ණය නීත්‍යානුකූලව ඉල්ලා සිටිය හැක. **(ලකුණු 04)**

**(මුළු ලකුණු 10)**

***03 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර***

| |
|---|
| **5 වන ඒකකය - සමාගම් නීතිය සහ හවුල් ව්‍යාපාර නීතිය** |
| ඉගෙනුම් ප්‍රතිඵල - හවුල්කරුවන් සහ තෙවන පාර්ශව අතර සම්බන්ධතාව සඳහන් කිරීම. |
| - හවුල්කරුවෙකුගේ වගකීම් ලැයිස්තුගත කිරීම සහ පැහැදිලි කිරීම. |

**(a)** හවුල් ව්‍යාපාර ආඥා පනත යටතේ, හවුල් ව්‍යාපාරයක් යනු ලාභය අරමුණු කරගනිමින් පොදුවේ ව්‍යාපාරයක් කරගෙන යාමට එකඟ වූ පුද්ගලයන් අතර සම්බන්ධතාවකි. හවුල් ව්‍යාපාරයක නියැලීමේදි සිදුවන ණය සහ බැඳීම් සඳහා සියළු හවුල්කරුවන් සාමූහිකව වගකිව යුතු බව ස්ථාපිත කරයි.

**මෙම අවස්ථාවේදී:**

- **අනුර, බිමල්** සහ **චාමික** එක්ව ලාභ බෙදා ගනිමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට එකඟ වීම තුලින් වලංගු හවුල් ව්‍යාපාරයක් ඇති විය
- **බිමල්** ප්‍රාග්ධනයට දායක වූ අතර ලාභයෙන් කොටසකට හිමිකම් ඇති අතර එහි දෛනික මෙහෙයුම් සඳහා අඩුවෙන් සම්බන්ධ වූවත් හවුල් හවුල්කරුවෙකු ලෙස ඔහුගේ තත්වය පෙන්නුම් කෙරේ.
- හවුල් ව්‍යාපාර ආඥාපනත යටතේ හවුල්කරුවෙකු, ආයතනය සහ අනෙක් හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු වන අතර ව්‍යාපාර විෂයපථය තුළ එක් හවුල්කරුවෙකු විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා මුළු ව්‍යාපාරයම බැඳීමකට ලක් කරයි.
- **චාමික** විසින් හවුල් ව්‍යාපාර නාමයෙන් ආයතනයේ ව්‍යාපාර පුළුල් කිරීම සඳහා ණය ලබා ලබාගෙන ඇති බැවින් එය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලට ඇතුළත් වේ.

එබැවින්, කළමනාකරණයට සහභාගි නොවූ පමණින් **බිමල්ට** වගකීමෙන් ගැලවිය නොහැක. හවුල්කරුවෙකු ලෙස **චාමික** විසින් ලබාගත් ණය ඇතුළුව හවුල් ව්‍යාපාරයේ ණය සඳහා ඔහු සාමූහිකව මෙන්ම තනි තනිව වගකීමට බැඳේ. **(ලකුණු 06)**

**(b)** **චාමිකගේ** ක්‍රියාමාර්ග හවුල් ව්‍යාපාරයේ විෂයපථයට (සිල්ලර ව්‍යාපාර දාමය පුළුල් කරමින්) අයත් වන අතර, ඔහු හවුල් ව්‍යාපාර නාමය යටතේ ක්‍රියාකොට ඇත: හවුල් ව්‍යාපාර නීතිය යටතේ.

- හවුල්කරුවෙකුට සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු සඳහා ආයතනය හවුල් ව්‍යාපාරය වගකීමට බැඳීය හැකි ව්‍යංග අධිකාරියක් ඇත.
- **චාමික** මෙම අධිකාරියෙන් පිටත ක්‍රියා නොකළහොත් (උදා - පුද්ගලික පරිභෝජනය සඳහා මුදල් ණයට ගැනීම හෝ සම්බන්ධ නැති ක්‍රියාකාරකම්) ආයතනය ඔහුගේ ක්‍රියාවන් සඳහා වගකීමට බැඳේ.
- **චාමිකට** අධිකාරී බලයක් නොමැති බවට විශ්වාස කිරීමට සැපයුම්කරුට කිසිඳු හේතුවක් නොතිබූ නිසා හවුල් ව්‍යාපාරය සැපයුම්කරුට වගකිව යුතුය.

එබැවින් ණය මුදල සඳහා හවුල්කාරිත්වයට එරෙහිව ක්‍රියාත්මක කලහැකි අතර සැපයුම්කරුට **අනුර බිමල්** සහ **චාමික** යන සියලුම හවුල්කරුවන්ගෙන් සාමූහිකව ආපසු ගෙවීමක් ඉල්ලා සිටිය හැක.

**(ලකුණු** 04)

**(මුළු ලකුණු** 10)

*4 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුරු*

**හත්වන ඒකකය- කම්කරු නීතිය**

ඉගෙනුම් ප්‍රතිඵල - සේවකයෙකු හා ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු හඳුනා ගැනීම හා අදාල පරීක්ෂණ භාවිතා කරමින් සේවකයෙකු හා ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු වෙන්කර හඳුනා ගැනීම.

**(a)** කම්කරු නීතිය යටතේ පුද්ගලයෙකු සේවකයෙකු ලෙස හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස වර්ගීකරණයේදී, සේවා ගිවිසුම සහ සේවා සඳහා ගිවිසුක් අතර වෙනස හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.

- සේවා ගිවිසුමක් යනු සේවායෝජකයෙකුගේ මඟපෙන්වීම, පාලනය සහ අධීක්ෂණය යටතේ පුද්ගලයෙකුගේ රැකියා සම්බන්ධතාවයයි. සේවකයාට සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) දායක මුදල් සහ වැටුප් සහිත නිවාඩු වැනි ව්‍යවස්ථාපිත ආරක්ෂාවන් සඳහා හිමිකම් ඇත.
- සේවා සඳහා ගිවිසුමක් යනු පුද්ගලයෙකු ස්වයං රැකියාවක නියැළෙන අතරතුර සේවාදායකයෙකුට නිශ්චිත සේවාවන් සැපයීම සඳහා නිදහස් කොන්ත්‍රාත්කරුවෙකු හෝ නිදහස් සේවකයෙකු ලෙස ඇතිකර ගන්නා ගිවිසුමකි. මෙම ආකාරයේ ගිවිසුම් යටතේ සිටින පුද්ගලයන් හට සාමාන්‍යයෙන් සේවකයින්ට ලබා දී ඇති බොහෝ කම්කරු නීති ආරක්ෂණ සඳහා හිමිකම් නොලැබෙයි. **(ලකුණු** 04)

**(b)** රැකියා සම්බන්ධතා ස්වභාවය තීරණය කරගැනීම සඳහා අධිකරණය විසින් සාමාන්‍යයෙන් විවිධ පරීක්ෂාවන් යොදා ගනී:

(1) පාලන පරීක්ෂණය - රැකියාව සිදුකරන්නේ කෙසේද, කවදාද සහ කොහේද යන්න සේවායෝජකයා විසින් පාලනය කරයි ද යන වග?

(2) ඒකාබද්ධ පරීක්ෂණය (Integration Test) යම් පුද්ගලයෙක් ආයතනයට ඒකාබද්ධව සිටීද යන්න වග?

(3) ආර්ථික සත්‍යතා පරීක්ෂණය - (Economic Reality Test) - පුද්ගලයා ව්‍යාපාර අවදානමක් දරා ගනිමින් තම ඉපයීම් පාලනය කරන්නේද යන වග ?

(4) උපකරණ පරීක්ෂණය - අදාළ පුද්ගලයා තමාගේම මෙවලම් උපකරණ භාවිතා කරනවාද යන වග ?

**කරුණුවලට නීතිමය පරීක්ෂාවන් යොදා ගැනීම:**

- පාලන පරීක්ෂණය - **ඩිලානි** සමාගමේ අධීක්ෂණය යටතේ සේවය කරනු ලැබීය. සමාගමේ වැඩ කාලය තුළ සේවය කළ අතර කළමණාකරුට වාර්තා කරන ලදී. මෙමගින් සේවායෝජකයාගේ ඉහළ මට්ටමේ පාලනයක් පෙන්නුම් කෙරේ.
- ඒකාබද්ධ පරීක්ෂණයඃ ඇය සමාගම පරිශ්‍රය තුළ සේවය කළ අතර දෛනික මෙහෙයුම් කටයුතුවල නිරත විය. මෙමගින් පෙන්නුම් කෙරෙන්නේ ඇය සමාගමේ ව්‍යුහයට සම්බන්ධ වී ඇති බව.
- ආර්ථික සත්‍යතා පරීක්ෂාව සහ උපකරණ පරීක්ෂාවඃ **ඩිලානි** සමාගමේ උපකරණ භාවිතා කර ස්ථාවර මාසික වැටුපක් යටතේ සේවය කළ අතර, සේවක සම්බන්ධතාවයක ලක්ෂණයක් වන වැටුප් සහිත නිවාඩු සඳහා හිමිකම් ලබන ලදී.

ඊට වෙනස් අයුරින්, **රුවන්** තමාගේම කාල සටහනක් අනුව තමාගේම මෙවලම් භාවිතා කරමින් විවිධ සේවා යෝජකයින් කිහිපදෙනෙකු සඳහා වැඩ කළ අතර, නිම කරන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීම් කරන ලද අතර එයින් පෙන්නුම් කෙරෙන්නේ ඔහු නිදහස් සේවකයෙකු බවත් සේවා සඳහා ගිවිසුමක් යටතේ සේවය කරන බවත් ය.

ඒ නිසා, අනුව **ඩිලානි** සේවා ගිවිසුමක් යටතේ සේවය කරමින් සිටි බැවින් ඇය සේවකයෙකු වන අතර සේවය අවසන්වීමෙන් පසු දැනුම් දීමක් හෝ වන්දි ගෙවීමක් ඇතුළුව කම්කරු නීති යටතේ ඇයට ආරක්ෂාව ලැබේ. ඇය සමාගමේ සේවිකාවකි. **(ලකුණු 06)**

**(මුළු ලකුණු 10)**

*05 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

**8 වන ඒකකය - රක්‍ෂණ නීතිය**
ඉගෙනුම් ප්‍රතිඵල - උපරිම විශ්වාසය, රක්‍ෂණ හිමිකම, හානිපූර්ණය, ආසන්නතම හේතුව, ආදේශණය ඇතුළුව රක්‍ෂණ ගිවිසුමකට අදාල වන මූලධර්ම පැහැදිලි කිරීම.

**(a)**

- **රක්‍ෂණ හිමිකම:**
  රක්‍ෂණ ගිවිසුමක් සඳහා රක්‍ෂණ හිමිකමක් තිබිය යුතු අතර එසේ නොමැති විට රක්‍ෂණ ගිවිසුම අවලංගු වේ. ඒ අනුව රක්‍ෂණ හිමිකම යනු අදාල විෂය වස්තුව රක්‍ෂණය කිරීමට රක්‍ෂිතයාට ඇති අයිතිය ලෙස අර්ථ දැක්විය හැකිය.

- **හානි පූර්ණය:**

  මෙය රක්ෂිතයාට සිදුවූ අලාභයේ ප්‍රමාණයට වන්දි ලබාගැනීමට ඇති අයිතිය වන අතර, ඊට වඩා වැඩියමක් ලැබිය නොහැකි බව පිළිබඳ සංකල්පය වේ. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කළහොත් මෙය සිදුවූ අලාභය හෝ හානිය සඳහා පමණක් වන්දි ගෙවීම වන අතර රක්ෂණයෙන් ලාභ උපයා නොගත යුතුවේ. රක්ෂණ ගිවිසුමකදී රක්ෂකයා විසින් රක්ෂිතයාගේ හානියේ සත්‍ය ප්‍රමාණය රක්ෂණ ඔප්පුව මගින් ආවරණය වන මුදලට යටත්ව වන්දි වශයෙන් ලබාදේ.

- **ආදේශනය:**

  රක්ෂණ සමාගම විසින් රක්ෂිත දේපළට සිදුවූ හානිය සඳහා වන්දි ගෙවා ඇති විට රක්ෂිතයාට බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගත හැකි වෙනත් වාසි සහ අයිතිවාසිකම් රක්ෂකයා වෙත පැවරීම ආදේශනය ලෙස හැඳින්වේ. මෙම සංකල්පය හානිපූර්ණ මූලධර්මයේ ප්‍රතිඵලයක් ලෙස පැන නැගී ඇත.

- **උපරිම විශ්වාසය මූලධර්මය:**

  රක්ෂණ ආවරණයක් අයදුම්කරනු ලබන පුද්ගලයාට බාර වූ කාර්යයක් වන්නේ සද්භාවයෙන් විමසීමකින් තොරව සියළු තොරතුරු රක්ෂකයාට හෙළිදරව් කිරීමයි. මන්ද, රක්ෂකයා කිසිවක් නොදන්නා අතර රක්ෂිතයා විසින් සියළු තොරතුරු දන්නා බැවිනි. මෙහිදී රක්ෂිතයා විසින් තමන් දන්නා තොරතුරු පමණක් නොව රක්ෂකයාට අවදානම නිසි ලෙස තක්සේරු කරගැනීමට රක්ෂිතයා විසින් දැනගත යුතු සියළු කරුණු සියල්ල හෙළිකළ යුතුය.

**(එකකට ලකුණු 02 බැගින් ලකුණු 04)**

**(b)** මෙම අවස්ථාවේදී සීමාසහිත **SafeGuard රක්ෂණ පොදු සමාගම** විසින් සිදුවූ දැඩි හානියට ආසන්නතම හේතුව සොරකමම නොව අධික වර්ෂාව බවට තර්ක කිරීමට හැකියාව පවතී. රක්ෂණ නීතියේදී ආසන්නතම හේතුව යනු හානියට ඍජුවම හේතු වන ප්‍රධාන හෝ බලවත්ම හේතුව වේ.

රක්ෂණ ඔප්පුව මගින් සොරකම් ආශ්‍රිත හානි පමණක් ආවරණය කරයි නම් සහ වර්ෂාව වැනි ස්වභාවික විපත් නිසා සිදුවන හානි බැහැර කරයි නම් රක්ෂකයා විසින් ජලයෙන් සිදුවූ හානිය සඳහා වන වගකීම ප්‍රතික්ශේප කළ හැකිය.

කෙසේ වුවද, ජනේල කැඩීයාමට ඍජුවම සොරකම හේතු වී වර්ෂාව ඇතුලට පැමිණ අභ්‍යන්තරයට හානි වූයේ නම් මූලිකවම රක්ෂණය ගත් අවදානම (සොරකම) සමස්ථ සිදුවීම් දාමයේ ආසන්නතම හේතුව ලෙස සැලකිය හැකිය. එවැනි අවස්ථාවක ජල හානිය සොරකමේ ස්වභාවික ප්‍රතිවිපාකයක් ලෙස දැකිය හැකිය. එබැවින් සොරකම සම්පූර්ණ අලාභය සිදුවීමට තුඩු දෙන හේතුව බව පෙන්වීමට හැකි නම් ජල හානිය ඇතුළු සම්පූර්ණ හානිය සඳහා වන්දි ගෙවීමට **SafeGuard රක්ෂණ පොදු සමාගම** වගකීමට බැඳේ. **(ලකුණු 06)**

**(මුළු ලකුණු 10)**

*06 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

| | |
|---|---|
| **9 වන ඒකකය -** | **ව්‍යාපාර පරිසරයට අදාල වැරදි, සහ නව රෙගුලාසි සහ සුරැකුම්පත් වෙළඳාම** |
| ඉගෙනුම් ප්‍රතිඵල - | ව්‍යාපාරික පරිසරය සම්බන්ධයෙන් අදාල පනත්වල භාවිතය හඳුනාගෙන පැහැදිලි කිරීම(මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, තොරතුරු දැනගැනීමේ පනත, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, බුද්ධිමය දේපළ පනත, විද්‍යුත් ගනුදෙනු පනත සහ පුද්ගලික දත්ත ආරක්ෂණ පනත). |

**(a)** (1) මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි.

(2) පුද්ගල ජාවාරම.

(3) අල්ලස්.

(4) විනිමය පාලනය උල්ලංඝනය කිරීම්.

(5) ත්‍රස්තවාදය.

(6) අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ.

(7) සයිබර් අපරාද, ගිණි අවි ආඥා පනත යටතේ වැරදි, පුපුරන ද්‍රව්‍ය.

(8) ළමුන්ට එරෙහි වැරදි

(9) මරණ හෝ සිර දඩුවම් ලැබිය හැකි වැරදි.

(10) පිරමීඩ වංචා **(එකකට ලකුණු 1 බැගින් ලකුණු 04)**

**(b) (i)** **ප්‍රකාශන අයිතිය:** ශාස්ත්‍රීය, කලාත්මක සහ විද්‍යාත්මක කාර්යයන්හි නිර්මාණකරුවන්ට එකී නිර්මාණ සම්බන්ධයෙන් ඇති ආර්ථික සහ සදාචාරාත්මක අයිතිවාසිකම් ප්‍රකාශන හිමිකම ලෙස හැඳින්වේ. බුද්ධිම දේපළ පනතේ 06 වන වගන්තියට අනුව නිර්මාණකරුවන්ට ආර්ථික සහ සදාචාරාත්මක අයිතිවාසිකම් හිමිවේ. **(ලකුණු 02)**

**(ii)** **වෙළඳ ලකුණ:** එක් ව්‍යාපාරයක භාණ්ඩ තවත් ව්‍යාපාරයක භාණ්ඩවලින් වෙන්කර හඳුනාගනු ලබන ඕනෑම ලකුණක්, වචනයක්, සංකේතයක්, උපාංග, වර්ණ, හැඩයන් හෝ දෙකෙහිම සංයෝජනයන් "වෙළඳ ලකුණක්" ලෙස අර්ථ දැක්විය හැකිය. **(ලකුණු 02)**

**(c)**
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ථවාදී කටයුතු සඳහා මුදල් යෙදවීම වැළැක්වීම සහ එවැනි ක්‍රියාකාරකම් සොයා ගැනීම.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ථවාදයට මුදල් සැපයීමේ අපරාධ විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සඳහා අධිකාරියන් පිහිටු වීම.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්ථවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා නිසි පියවර ගැනීමට ඇතැම් ආයතනවලට අනිවාර්ය කරන ලදී. **(එකකට ලකුණු 1 බැගින් ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

***B කොටසේ අවසානය***

*<u>අනිවාර්ය ප්‍රශ්නයකි (01)</u>*

**C කොටස**

(මුළු ලකුණු 25)

*07 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

| | | |
|---|---|---|
| **2 වන ඒකකය** | **- ගිවිසුම් නීතිය** | |
| **3 වන ඒකකය** | **- භාණ්ඩ විකිණීමේ නීතිය** | |
| ඉගෙනුම් ප්‍රතිඵල | - | ගිවිසුමක නියමයන් (කොන්දේසි,ප්‍රතිඥාභාර,වගකීමෙන් බැහැර වගන්ති) සහ වගකීමෙන් බැහැර වගන්තිවල ප්‍රතිවිපාක හා 1997 අංක 26 දරණ අසාධාරණ ගිවිසුම් නියාමන පනත පැහැදිලි කිරීම. |
| | - | ගිවිසුමක් කඩ කිරීම සමබන්ධයෙන් පාර්ශවයන්ට ඇති ප්‍රතිකර්ම විමසීම. |
| | - | අයිතිය හා අවදානම් මාරුවන අවස්ථාව විමසීම. |
| | - | මිලදී ගන්නාට හා විණුම්කරුට ඇති ප්‍රතිකර්ම පැහැදිලි කිරීම. |

**(A) (a)**

- හානි සඳහා නඩු පැවරීම.
- නියත ඉටු කිරීමක් සඳහා නඩු පැවරීම.
- ගිවිසුම අවලංගු කිරීම.
- තහනම් නියෝගයක් සඳහා නඩු පැවරීම.
- සංශෝධනය කිරීම [Rectification]. **(එකකට ලකුණු 1 බැගින් ලකුණු 03)**

**(b)** ගිවිසුම් නීතියේදී, කොන්දේසිය ගිවිසුමේ මූලික හරය දක්වා විහිදෙන මූලික වගන්තියකි. කොන්දේසියක් කඩ කිරීම මගින් අහිංසක පාර්ශවයට ගිවිසුම් අවසන් කර හානි සඳහා හිමිකම් ඉල්ලා සිටීමට ඉඩ සලසයි. අනෙක් අතට ප්‍රතිඥාභාරයක් යනු ගිවිසුමක සුළු කරුණක් වන අතර එය උල්ලංඝනය හේතුවෙන් සිදුවන්නේ වන්දි සඳහා හිමිකම් පෑමක් මිස අවසන් කිරීමක් නොවේ.

**මෙම අවස්ථාවේදී:**

- තාක්ෂණික පෙරහුරු දින 05 තුළම සහභාගී විය යුතු බවට වන වගන්තිය ගිවිසුමේ ඇතුළත් කර තිබූ අතර එමගින් එය ගිවිසුමේ පාර්ශවවලට වැදගත් යැයි සැලකිය හැකියැයි යෝජනා කෙරේ.
- කෙසේවුවද, වෛද්‍ය හේතූන් මත **කලනි පෙරේරා** පළමු දින දෙක තුළ පමණක් මඟ හැරුණු අතර, ඉතිරි සැසිවාර සඳහා නොපැකිලිව සහභාගී විය.
- අවසාන සම්පූර්ණ වේදිකා ධාවනයේදී ඇය දෝෂ රහිතව ක්‍රියා කළ අතර ප්‍රසංග චාරිකාව සඳහා සම්පූර්ණයෙන්ම සූදානම්ව සිටියාය.
- ඇය නොපැමිණීම ගිවිසුමේ අරමුණ ඉටුවීමට බාධාවක් නොවීය.

අතපසුවූ දිනයන් නිසා **කලනිගේ** සමස්ථ සූදානමට හෝ රංගන කාර්යයේ ගුණාත්මක භාවයට බල නොපා ඇති බැවින් එම වගන්තිය කොන්දේසියක් නොව ප්‍රතිඥාභාරයක් ලෙස සැලකිය හැකිය. එබැවින් **Golden Stage Productions** ආයතනය ගිවිසුම වැරදි ලෙස අවසන් කර තිබිය හැකිය.

**(ලකුණු 06)**

**(c)** අදාල ව්‍යාතිරේක වගන්තියේ සඳහන් වන්නේ,

*"කිසිම තත්වයන් යටතේ රංගන ශිල්පීන් අවලංගු කිරීම හෝ ආදේශ කිරීම හේතුවෙන් පැන නගින කිසිදු හිමිකම් පෑමක් හෝ වන්දියක් සඳහා සමාගම වගකියනු නොලැබේ ."*

එවැනි වගන්ති වගකීමේ බැහැර වීමේ හෝ මුක්ත වගන්ති ලෙස හඳුන්වනු ලබන අතර ඒවායේ වලංගුභාවය නීතිමය මූලධර්ම කීපයක් මත රඳා පවතී.

(1) **නීතිගත කිරීම –** වගන්තිය ලිඛිත ගිවිසුමට ඇතුළත් කර ඇති බැවින් එය ගිවිසුම්කාරව වලංගු වේ.

(2) **පැහැදිලිබව** - වචන යෙදීම පුළුල්ය.(ඕනෑම තත්වයක් යටතේ) විශේෂයෙන් එක් පාර්ශවයකට සැළකිය යුතු ලෙස වැඩි කේවල් කිරීමේ බලයක් ඇති විට අධිකරණය විසින් සාමාන්‍යයෙන් එවැනි වගන්ති පටු ලෙස අර්ථකථනය කරයි.

(3) **සාධාරණ නොවීම හෝ සාධාරණ නොවන වගන්ති** - වගන්තිය අසාධාරණ ප්‍රථිපලයකට තුඩු දෙන්නේ නම් (උදා ගිවිසුම ඉටු කිරීමට සූදානම් රංගන ශිල්පියෙකුට ගෙවීම ප්‍රතික්ෂේප කිරීම ) අධිකරණය විසින් එය අවලංගු කිරීමට හෝ එහි විෂය පථය සීමාවට ලක්කල හැකිය.

(4) **මූලික කඩ කිරීම** - බරපතල උල්ලංඝනයකදී පවා නූතන නීතිය වගකීමෙන් බැහැර වීමේ වගන්ති යොදාගත හැකි බව නූතන නීතිය පිළිගනී. නමුත් වගන්තිය පැහැදිලි සහ සිදුවූ විශේෂ කඩ කිරීමේ වර්ගය ආවරණය කරන විට පමණක් වේ.

**මෙම අවස්ථාවේදී :**

- වගන්තිය මගින් **Golden Stage Productions** ආයතනය වගකීමෙන් ආරක්ෂාවන නමුත් **කමල්ට** ඉදිරිපත් කිරීමට හැකියාව තිබියදීත් වැරදි ලෙස ඉවත් කළ අවස්ථාව සඳහා වගන්තිය යොදා ගැනිම අසාධාරණ බව අධිකරණයන්ට පෙනී යා හැකිය.
- එබැවින් අසාධරණව වැරදි ලෙස අවසන් කිරීමේදී විය හැකි අනිසි භාවිතය පිළිබඳ සැළකිළිමත් වීම හේතුවෙන් **Golden Stage Productions** ආයතනය වගකීමෙන් සම්පූර්ණ වශයෙන් ආරක්ෂා කිරීමට වගන්තියට නොහැක. **(ලකුණු 06)**

**(B) (a)** ඔව්, සැපයුම්කරුවා වන **සීමාසහිත Medi-Co සමාගම** භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ වන නියැදිය අනුව විකිණීමට අදාල ව්‍යාංග කොන්දේසියක් උල්ලංඝනය කොට ඇත.

භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව, නියැදිය අනුව භාණ්ඩ විකිණීමේදී ගම්‍ය වන කොන්දේසි වන්නේ:

(1) තොගය ගුණාත්මකව නියැදියට අනුරූප විය යුතුය.

(2) තොගය නියැදිය සමග සැසඳීමට ගැනුම්කරුට සාධාරණ අවස්ථාවක් තිබිය යුතුය.

(3) නියැදිය සාධාරණ ලෙස පරීක්ෂාකිරීමේදී නොපෙනෙන කිසිඳු දෝෂයකින් භාණ්ඩ තොගය නිදහස් විය යුතුය.

මෙම සිදුවීමේදී **වෛද්‍ය ලේඛා** සැපයුම්කරුගේ ගබඩාවේ පැවති ඖෂධ නියැදියක් පරීක්ෂා කරනු ලැබීය. කෙසේ වුවද බෙදාහරින ලද ඖෂධ පෙට්ටි නියැදියේ සඳහන් නිෂ්පාදනකයාගේ නොවූ අතර නිසි සහතික කිරීමක් සහ ඇසුරුම්කරණයක් නොවීය. මෙය නියැදියේ ගුණාත්මක භාවය සහ හඳුනාගැනීමේ (නියැදිය පිළිබඳ තොරතුරු) පැහැදිලි අපගමනයක් වන අතර එමගින් ව්‍යාංග කොන්දේසිය උල්ලංඝනය වේ.

එබැවින් නියැදිය අනුව විකිණීම යන ව්‍යාංග කොන්දේසිය යටතේ භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීමට සහ ගිවිසුම කඩ කිරීම නිසා මුදල් ආපසු ගෙවීමක් හෝ හානි සඳහා වන්දි ඉල්ලා සිටීමට **වෛද්‍ය ලේඛාට** (හෝ රෝහලට) අයිතියක් ඇත. **(ලකුණු 05)**

**(b)** ඔව්, මෝටර් රථ අලෙවිකරුවන **වන්ක මහතා** භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ මූලික කොන්දේසියක් වන විකිණීමට ඇති අයිතිය උල්ලංඝනය කළේය,

භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 14(a) වගන්තිය යටතේ, විකුණුම්කරුට භාණ්ඩ විකිණීමට ඇති අයිතිය පිළිබඳ ව්‍යාංග කොන්දේසියක් ඇත. විකුණුම්කරු සැබෑ හිමිකරු නොවේ නම් හෝ විකිණීම සඳහා අධිකාරියක් නොමැති නම් ගැනුම්කරුට කිසිඳු හිමිකමක් නොලැබෙන අතර මුල් හිමිකරුට නැවත භාණ්ඩ ලබාගත හැකිය.

මෙම සිදුවීමේදී **වෛද්‍ය ලේඛා වන්ක මහතාගෙන්** මිලට ගත් මෝටර් රථයේ නීත්‍යානුකූල හිමිකරු ඔහු නොවන බව පෙනී ගිය අතර එය සොරකම් කල එකක් බවට වාර්තා විය. සැබෑ හිමිකරු නැවත මෝටර් රථය ලබාගත් හෙයින් විකුණුම්කරුට එය විකිණීමට අයිතියක් නොමැත.

මෙය බරපතල ලෙස කොන්දේසි කඩ කිරීමක් වන අතර **වෛද්‍ය ලේඛා** හට පහත අයිතිවාසිකම් ඇත.

- ගිවිසුම තව දුරටත් ඉටු කිරීම ප්‍රතික්ෂේප කිරීම.
- ගෙවූ මුදල් නැවත ආපසු ඉල්ලා සිටීම.
- විකුණුම්කරුගෙන් (සොයාගත හැකිනම් සහ බුන්වත් නොවේ නම්) හානි සඳහා වන්දි ඉල්ලා සිටිය හැක. **(ලකුණු 05)**

**(මුළු ලකුණු 25)**

***C කොටසේ අවසානය***